**කුරුවිට ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට කර්මාන්ත 40 ක් වෙනුවෙන් ලැබිය යුතු රු. 47,660,468 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී ගලපා ගැනීම සඳහා සටහන් කර ගෙන ඇත. |
| (ආ) | වාහන නඩත්තු වියදම් රු. 74,143 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී ගලපා ගැනීම සඳහා සටහන් කර ගෙන ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද පුටුවල වටිනාකම රු. 162,626 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී ගලපා ගැනීම සඳහා සටහන් කර ගෙන ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 2,808,793 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී ගලපා ගැනීම සඳහා සටහන් කර ගෙන ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් හා අක්කර බදු ආදායම රු. 373,074 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී ගලපා ගැනීම සඳහා සටහන් කර ගෙන ඇත. |
| (ඊ) | ගිණුම් විෂයයන් 07 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 61,948,038 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන හා අදාල උපයෝගී ලේඛනවල ගිණුම් ශේෂ නිවැරදිව දැක්විය යුතුවේ. | මාසික ලැබීම් සමඟ පරීක්ෂා කර බලා සංසන්දනය කර නිවැරදි කිරීමට උපදෙස් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (උ) ආදායම් ශීර්ෂ 06 කට අදාලව ඒකාබද්ධ ලැබීම් සාරාංශය අනුව රැස්කල ආදායම හා සාරාංශ ආදායම් ලේඛනය අනුව රැස්කල ආදායම අතර රු. 830,305 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා අදාල උපයෝගී ලේඛනවල ගිණුම් ශේෂ නිවැරදිව දැක්විය යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී සුපරික්ෂාකාරීව අවසන් ගිණුම සැකසීමට උපදෙස් දී ඇත. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 204 | 2016 හා 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වලින් අනාවරණය කර තිබූ වටිනාකම රු. 87,875 ක් වූ භාණ්ඩ ඒකක 11 ක හා පොත් 384 ක ඌනතාවය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඌන පොත් සහ භාණ්ඩ සම්බන්ධයෙන් අයකර ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල ලබාදී තිබූ රු. 932,308 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳ විෂයය නිලධාරීන් දැනුවත් කර ඇති අතර, අත්තිකාරම් පියවීමට කටයුතු කරමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 2001 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාල රු. 11,527,994 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දැනට තැන්පත් ලේඛන යාවත්කාලීන කිරීම සඳහා වැය ලේඛන වවුචර්පත් සියල්ල පරීක්ෂා කරමින් කටයුතු කරගෙන යනු ලැබේ. මේ සඳහා සැලකිය යුතු කාලයක් ගතවන බවද සඳහන් කරමි. |
| | (iii) මුදල් රෙගුලාසි 1645 | සභාව සතු වාහන 08 ක ධාවන සටහන් නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු වාහන වල ධාවන සටහන් 2019 වසර සඳහා නියමිත පරිදි විගණනය සඳහා ඉදිරිපත් කිරීමට ඉදිරි කටයුතු කිරීමට උපදෙස් දී ඇත. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 03 ඡේදය | අපහරණය සඳහා සුදුසු වාහන හඳුනා ගැනීම, පත්කර ගන්නා විශේෂ සමීක්ෂණ මණ්ඩලයකින් සිදු නොකර රත්නපුර ඩිපෝවේ සහකාර ඉංජිනේරුවරයෙකු ලවා වාහන 03 කට අපහරණ නිර්දේශ ලබාගෙන තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතුව විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් හා සමාන දැනුමැති පුද්ගලයන් නොමැති බැවින් ඩිපෝ ඉංජිනේරු ලවා එම වාහන පරීක්ෂා කර බලා එම වාර්තාවන් ලබා ගත්තෙමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 1.3 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව සභා බල ප්‍රදේශය තුල වීථි ලාම්පු කට්ටල 25 ක් සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නව කටයුතු සිදු කිරීමේදී නිසිලෙස කටයුතු කරන බව සඳහන් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 7,556,116 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,298,073 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,361,429 | 3,492,486 | 3,451,687 | 4,603,567 | 2,313,624 | 3,551,623 | 4,222,649 | 3,854,219 |
| (ii) | කුලී | 6,889,007 | 6,638,685 | 6,810,605 | 1,720,321 | 7,345,665 | 6,608,828 | 6,626,857 | 2,598,147 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,225,150 | 2,080,378 | 2,076,028 | - | 1,773,000 | 2,643,275 | 2,636,040 | - |
| (iv) | වෙනත් ආදායම් | 21,777,804 | 28,394,418 | 23,473,754 | 38,830,796 | 41,701,040 | 38,762,500 | 21,345,725 | 40,027,736 |

#### 2.2.2 වරිපනම් හා බදු

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 4,090,976 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 1,851,336 ක් වූ වරිපනම් ඒකක 301 ක් ඇතුලත් වී තිබුණි. හිඟ ශේෂ අය කර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | මේ වන විට ආදායම් පරීක්ෂකවරු දැනුවත් කර හිඟ බදු වලින් සියයට 30 ක් පමණ අයකරගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 512,592 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 376 කින් අයවිය යුතු රු. 269,809 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ ආදායම් රැස් කර ගැනීමට විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | නැවත පරීක්ෂාවක් කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමට සිදු වේ. |

### 2.2.3 කුලී
----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයේදී නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 05 ක් ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ලබාදීම හේතුවෙන් ගෙවීම් පැහැරහැර තිබෙන හිඟ කඩකුලිය රු. 4,436,000 ක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | කඩකාමර බදුදීමේදී නිසි පරිදි ගිවිසුම්ගත වියයුතු අතර, වගකිව යුත්තන් නිශ්චය කර විනයානුකූලව කටයුතු කළ යුතුවේ. | එකල සිටි නිලධාරීන් දැන් සේවයේ නොමැති බැවින් විනය ක්‍රියාමාර්ග ගත නොහැකි තත්ත්වයක් ඇත. මෙම හිඟ මුදල කපා හැරීමට සභාවට ඉදිරිපත් කලද අනුමැතිය දී නැත. එබැවින් නැවත පළාත් පාලන කොමසාරිස් ගේ උපදෙස් ලබා ගැනීමට අදහස් කර ඇත. |
| (ආ) | නව වෙළඳ සංකීර්ණයේ අංක 30 කඩකාමරය 2013 වර්ෂයේදී ගිවිසුමක් මඟින් රු. 3,420 ක මාසික කුලියකට බදු දී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව කඩකුලී නොගෙවන අවස්ථාවේදී නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර බදු කාලය අවසන්වීමෙන් පසු 2017 වර්ෂය දක්වා ගිවිසුම් රහිතව කඩකාමරය පවත්වාගෙන යාමට ඉඩහැර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ බදුකුලී හා දඩ වශයෙන් එකතුව රු. 202,895 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර අදාල කඩකාමරය 2017 අගෝස්තු සිට ආදායම් ඉපයීමකින් තොරව වසා දමා තිබුණි. | ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතු අතර, කඩකාමරය බදුදී ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. | තෙවන වරටත් ටෙන්ඩර් කලද කිසිදු ටෙන්ඩර් පතක් හෝ ඉදිරිපත් නොවුනු බැවින්, ටෙන්ඩර් මුදලින් සියයට 10 ක් අඩු කර ටෙන්ඩර් කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන සකස් කරමින් පවතී. |

### 2.2.4 බලපත්‍ර ගාස්තු
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පරිසර බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනාගැනීම සඳහා සභාව විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි. නියැදි පරීක්ෂාවට අනුව 2018 මාර්තු සිට ජූනි දක්වා කාලපරිච්ඡේදය තුල වලංගු කාලය අවසන් වූ ආයතන 03 ක පරිසර බලපත්‍ර | පරිසර බලපත්‍ර නිකුත් කිරීම හා අළුත්කිරීම විධිමත් පරිදි සිදුකළ යුතුවේ. | බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් සොයා බැලීමට කටයුතු කරමින් පවතින අතර 2018 වර්ෂයේ අළුත්කිරීමට තිබූ බලපත්‍ර සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අළුත් කරගෙන නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු. 4,323,105 ක් වූ අතර, 2015 හා 2016 වර්ෂ දෙකට අදාලව ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 42,461,294 ක් විය. 2017 හා 2018 වර්ෂ දෙකට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු 2019 ජනවාරි වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත ලැබිය යුතු ආදායම් රැස්කර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ ප්‍රේෂණ පළාත් සභාව වෙත යැවීම සඳහා සකස් කරමින් පවතින අතර, මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා පළාත් ආදායම් කොමසාරිස් වෙත යවා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංවර්ධන, පරිසර හා සෞඛ්‍ය, පුස්තකාල, පෙරපාසැල් හා ආයුර්වේද යන අංශ විසින් වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති/ ඉදිකිරීම් හා අපේක්ෂිත ක්‍රියාකාරකම් දක්වා නොතිබුණු අතර සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත කාල වකවානු දක්වා නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් සියළු ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා නිශ්චිත කාලවකවානු හඳුනාගෙන තිබිය යුතුවේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී නිවැරදි කර ඇත. |

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම මඟින් සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු. 10,510,000 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 31 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, මහජන නියෝජිත අදහස් හා යෝජනා සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවීම හේතුවෙන් එම ව්‍යාපෘති කිසිවක් වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | බල ප්‍රදේශය තුල ඉටු කල යුතු සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රමුඛතාවය හඳුනාගෙන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | අදාළ කාල වකවානුව තුල මහජන නියෝජිත අදහස් යෝජනා මත සභාවේ අනුමත ව්‍යාපෘති සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබාදී ක්‍රියාත්මක කර ඇත. |

**(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කුරුවිට පැරඩයිස් නව ජනපද ජල ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේදී රු. 1,582,215 ක් වැය කර කපන ලද ළිඳෙහි ජලය මලකඩ සහිත වීම නිසා 2015 වර්ෂයේදී රු. 270,000 ක් වැයකර ළිඳ වටා වැලි ස්ථරයක් යොදා තිබුණද, ජලයෙහි වූ මලකඩ තත්ත්වය ඉවත් කර ජලය පානීය තත්ත්වයට ගෙන ඒමට නොහැකි වී තිබුණි. ළිඳ කැපීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට හෝ විශේෂඥ උපදෙස් ලබා ගැනීමට හෝ පියවර ගෙන නොතිබීම මෙයට හේතුවී තිබුණි. | මෙවැනි ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතු අතර ව්‍යාපෘතියේ අරමුණ වූ බීමට සුදුසු ජලය ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2015 වර්ෂයේ දී ළිඳ වටා වැලි ස්ථරයක් යෙදීම ජල සම්පාදන මණ්ඩලයේ අනුදැනුම මත හා ජල ව්‍යාපෘතියේ පරිපාලන නිලධාරී විසින් සිදුකරන ලද ඉල්ලීම මත සිදු කර ඇත. ජල පෙරනයේ ක්‍රියාකාරිත්වය අවසන් වූ පසු නැවත මලකඩ සහිත බව ඇතිවන බව කාර්මික නිලධාරී වාර්තා කර ඇත. එය පාරිසරික ක්‍රියාකාරකම් නිසා බව ද දැනුම් දී ඇත. ඒ සඳහා ජල පිරිපහදු ක්‍රමවේදයකට යා යුතු බවද සඳහන් කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය වනවිට මෙම ව්‍යාපෘතියෙන් ජලය ලබා ගන්නා ප්‍රතිලාභීන් 125 දෙනා වෙත සුදුසු පානීය ජලය නොලැබෙන බැවින් ප්‍රාදේශීය සභාව හා මානව සම්පත් සංවර්ධන පදනම එක්ව මේ සඳහා වැයකර තිබූ එකතුව රු. 9,952,874 ක් ඵලන උපයෝජිත වී තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ජලය ඉල්ලා ඇති ජල පාරිභෝගික සංඛ්‍යාව අනුව ජලය ලබා දී ඇත. පාරිසරික වෙනස්වීම් මත ජලයේ වෙනස්වීම් සිදුවන බැවින් ස්ථිර ජල පිරිපහදු ක්‍රමවේදයකට යන්නේ නම් විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. ඒ සඳහා අදාල ව්‍යාපෘතිය සතුව මුදල් නොමැති බව වාර්තා කරන අතර, මේ වනවිටත් ජල |

| | | |
|---|---|---|
| | | පාරිභෝගිකයින් මෙම ව්‍යාපෘතියේ ජලය ප්‍රතික්ෂේප නොකර පරිභෝජනය සඳහා ලබා ගන්නා බවත් සඳහන් කරමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද සභාව අපොහොසත් වී තිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | මේ වන විට පොහොරබාව ඉඩම තුල කසළ වෙන් කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකෙරෙමින් පවතින අතර එය අවසන් වූ විට කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට හා නොදිරන කසළ හැකි පමණ ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී. |

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | දිගුකාලීන සැලසුම් සකස් කර නැතිමුත් ඉදිරියේදී කිරීමට බලාපොරොත්තු වෙමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවා ගිවිසුම් මත බඳවාගත් සේවකයින් 05 දෙනෙකු වෙනුවෙන් 2011 සැප්තැම්බර් සිට 2018 ජූලි දක්වා වූ කාලය සඳහා සභා අරමුදලින් රු. 3,546,698 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට ක්‍රියා කළ යුතුවේ. | සභාව විසින් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවා ගිවිසුම් මත සේවකයින් යොදා ගැනීමට සිදුව තිබෙන්නේ, දෛනික සේවා කටයුතු සිදු කිරීමට අනුමත සේවකයින් ප්‍රමාණවත් නොවන බැවිනි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු. 149,950,452 ක් වූ ජංගම නොවන වත්කම් ඇතුලත් කර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කිරීමේ කටයුතු සිදු කිරීමට උපදෙස් දී ඇත. |

### 3.3.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ **04** ක් ධාවනයෙන් ඉවත් කර තිබූ කැබ් රථයක් හා වර්ෂයක කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබූ ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි. | අළුත්වැඩියා හා නඩත්තු කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුවේ. | එම වාහන තවදුරටත් අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතී. එම කටයුත්ත නිමවී ධාවනයට සුදුසු වූ වහාම ආදායම් බලපත්‍ර, දුම් සහතික, රක්ෂණ සහතික ලබා ගැනිමට ඉදිරි කටයුතු කරමි. |

### 3.3.3 පවරානොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2004 සිට 2015 දක්වා වූ කාලය තුල පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සහ සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබුණු වාහන 17 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භාවිතා කරන ලද වාහන වල අයිතිය ලිඛිතව පවරා ගත යුතුවේ. | පවරා ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමි. |
| (ආ) | සුසාන භූමි ලේඛනයේ ඇතුලත් සුසාන භූමි 50 න් 49 ක් සභාව වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | අදාල ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සුසානභූමි පවරා ගැනීමේ කටයුතු යාවත්කාලීනව සිදු කිරීමට උපදෙස් දී ඇත. |

### 3.3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 හා 2017 වර්ෂ වලදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් හා සබරගමුව පළාත් සභාවෙන් ලැබුණු ගලි ට්‍රේලර් 02 ක මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් නොමැති වීම හේතුවෙන් සභා භූමිය තුල නිෂ්කාර්යව තිබුණි. | අදාල සේවා සපයන වෙනත් පළාත් පාලන ආයතනයක් වෙත ලබාදීමට හෝ පියවර ගත යුතුවේ. | මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සභාව සතුව ස්ථානයක් මේ වන විටත් නොමැති බැවින් නිෂ්කාර්යව ඇත. |

### 3.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩසටහන යටතේ ලෝක බැංකු ආධාර මත 1997 වර්ෂයේදී කුරුවිට කුඩා නගර ජල සම්පාදන යෝජනා ක්‍රමය ආරම්භ කර තිබූ අතර, ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී ව්‍යාපෘති වියදමෙන් සියයට 20 ක ප්‍රජා දායකත්වයක් ලබා ගතයුතු බවටත්, ව්‍යාපෘතියේ වැඩ අවසන් වීමෙන් පසුව එය රාජ්‍ය පාලනයෙන් තොර ජනතාව විසින් පාලනය කරන ව්‍යාපෘතියක් විය යුතු බවටත් ලෝක බැංකුව විසින් කොන්දේසි පනවා තිබුණි. එහෙත් එකී කොන්දේසි වලට පටහැනිව, ප්‍රජාමූල සංවිධානය ශක්තිමත් කර යළි පවරාදීමේ අරමුණින් මාස 06 ක කාලයක් සඳහා 2006 සැප්තැම්බර් 01 දින සභාව යටතට පවරා ගෙන තිබූ ජල ව්‍යාපෘතිය වර්ෂ 12 ක් ගතවී තිබුණ ද එම සංවිධානය වෙත ආපසු පවරා දී නොතිබුණි. | ප්‍රජාමූල සංවිධානය ශක්තිමත් කර ජල යෝජනා ක්‍රමය එය වෙත පවරා දීමට හෝ සභාව විසින් පාලනය වන ජල ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | මානව සම්පත් සංවර්ධන පදනම නමින් පැවති ප්‍රජාමූල සංවිධානයේ පැවති අක්‍රමිකතා හේතුවෙන් පළාත් පාලන කොමසාරිස්තුමා මැදිහත්ව ප්‍රාදේශීය සභාවට එහි පරිපාලන බලතල මාස 06 කට පවරාදී ඇත. එහෙත් මෙතෙක් මානව සම්පත් සංවර්ධන පදනම සක්‍රීය තත්ත්වයේ නොමැති බැවින් ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවනු ලැබූ විධායක කමිටුවේ අධීක්ෂණය යටතේ කටයුතු සිදු කරගෙන යනු ලබයි. |

### 3.5 ප්‍රසම්පාදනය

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 7,735,565 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොමැත. |

සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 07 කට අදාලව එකතුව රු. 1,472,500 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම්සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂ වලදී පරීක්ෂා කර බලා වෙන් කිරීමට කටයුතු කරමි. එසේම මෙම වෙන් කිරීම්ද විෂයය නිලධාරීන් සමඟ සාකච්ඡා කර වෙන් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 කට අදාලව එකතුව රු. 1,042,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 80 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. | සැලසුම්සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂ වලදී පරීක්ෂා කර බලා වෙන් කිරීමට කටයුතු කරමි. එසේම මෙම වෙන් කිරීම්ද විෂයය නිලධාරීන් සමඟ සාකච්ඡා කර වෙන් කර ඇත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇත. |

### 4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් එකතුව රු. 8,888,411 ක් වූ ගිණුම් ශේෂ 04 ක් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අදාල ශේෂ තහවුරු කිරීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන හා ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුවේ. | මෙම ශේෂ පෙර සිට පැවතෙන අතර 2019 වසරේදී සකසන ගිණුම විගණනයට ඉදිරිපත් කරන විට ලබාදීමට උපදෙස් දී ඇත. |